3 වන පාඩම හා සබැදේ .

- ශ්‍රී ලංකාව සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමයක් ලෙසට **ජනමත විචාරණය** භාවිතයට ගනී .

**ජනමත විචාරණය යනු ඇතැම් කරුණු සම්බන්ධයෙන් සෘජුව මහජන කැමැත්ත විමසීමයි .**

**පාලන ක්‍රමයක් ලෙසට**

නිදසුන්

- නියෝජිතයන් තෝරාගනු ලබන්නේ මහජනතාවගේ බහුතර කැමැත්ත අනුවය.
- ආණ්ඩු බලය හිමි වන්නේ ජනතා ඡන්දයෙන් වැඩි නියෝජිත පිරිසක් තේරී පත්වූ පක්ෂයටයි.

ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වන ආකාරය

**ජීවන ක්‍රමයක් ලෙසට**

නිදසුන්

- තම යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විදීම
- අන්‍ය මත ගරු කිරීම
- සාකච්ඡා මගින් තීරණවලට එලබීම
- සමානාත්මතාව ගරු කිරීම

- ප්‍රජාතන්ත්‍රවාදය තුළ මහජනතාව සතු බලය → පරමාධිපත්‍ය බලයයි.


- පරමාධිපත්‍යයට → පාලන බලතල / මූලික අයිතිවාසිකම් / ඡන්ද බලය / ඇතුලත් වේ.

- ප්‍රජාතන්ත්‍රවාදය තුළ රාජ්‍යය සතු බලය ⟶ ස්වාධිපත්‍ය බලයයි .

- ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ස්වරූප දෙකකි .

✓ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය
✓ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ( නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය / නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය )

❖ **සෘජු ප්‍රජාතන්ත්‍රවාදය**



පුරවැසි සභාව

✓ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යනු ,

රටක ජනතාව එක ස්ථානයක රැස්වී සෘජුව හා ඉක්මනින් රාජ්‍ය පාලනය පිළිබඳ සාකච්ඡා කර ජනතා කැමැත්ත මත තීරණ ගන්න ක්‍රමයයි .

තීන්දු ගැනීමේ ක්‍රියාවලියට හා පාලන කටයුතු වලට පුරවැසියන් සෘජුව සම්බන්ධ වීම සෘජු ප්‍රජාතන්ත්‍රවාදයයි .

- සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක රටවලට නිදසුන්

උදා :- ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යය ( ග්‍රීසියේ අගනගරය ඇතැන්ස් )

- සෘජු ප්‍රජාතන්ත්‍රවාදය අතීතයේ ක්‍රියාත්මක කිරීම පහසු වීමට හේතු

→ මිනිසාගේ අවශ්‍යතා සීමිත වීම.
→ ජනගහනය සීමා සහිත වීම.
→ එක් ස්ථානයක රැස්ව සාකච්ඡා කිරීම පහසු වීම හා තීරණවලට එළඹීම පහසු වීම .

- සෘජු ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමයක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු

→ ජනගහනය අධික වීම .
→ එක් ස්ථානයක රැස්වීමේ අපහසුව.
→ මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණ වීම .
→ වර්තමාන පාලන කටයුතු සංකීර්ණ ස්වභාවයක් ගැනීම .

❖ <u>වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය</u>



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

✓ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යනු

ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීම දුෂ්කර වීම නිසා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය ආරම්භ විය 17 වන සියවසේදී යුරෝපයේ පාලන ක්‍රමයක් ලෙස භාවිත විය විවිධ චින්තකයන්ගේ අදහස් අනුව මෙම පාලන ක්‍රමය තව දුරත් පෝෂණය විය ඒ අනුව පාලනය සඳහා පාර්ලිමේන්තුව වැනි නියෝජිත ආයතන බිහි වී ඇත.

මහජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන් මගින් පාලන කටයුතු සිදු කිරීම වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි .

- වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය රටවලට නිදසුන්

ශ්‍රී ලංකාව ,ඉන්දියාව , ජපානය , එක්සත් රාජධානිය ,ප්‍රංශය , ස්විස්ටර්ලන්තය, ඇමරිකා එක්සත් ජනපදය , කැනඩාව

- නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණ

→ කලින් කලට මැතිවරණ පැවැත්වීම .
→ රාජ්‍යය පාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ( රටක උත්තරීතර ලියවිල්ල) නිතිය අනුව සිදුවීම .
→ නියමිත සුදුසුකම් සපුරාලන ජනතාවට ( වයස අවු 18 සම්පූර්ණ වීම ) සර්වජන ඡන්ද බලය හිමි වීම .
→ ඡන්ද කොට්ඨාස වලට රට බෙදා තිබීම (ශ්‍රී ලංකාව මැතිවරණ දිස්ත්‍රික්ක 22 කි )

- වර්තමානයේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරන රටවල ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඍජුව මහජන කැමැත්ත විමසීම සදහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඉඩ සලසා ඇත.

උදා :- ශ්‍රී ලංකාව ජනමත විචාරණය පැවැත්වීම ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයකට නිදසුනකි